# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2312/14 - 2022 දෙසැම්බර් මස 27 වැනි අඟහරුවාදා - 2022.12.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (XV)(බී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සමග කියවිය යුතු 27(1) වන උපවගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය පිහිටුවමින් එකී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද (කලින් කලට සංශෝධිත පරිදි වූ) 1995 නොවැම්බර් මස 7 වන දින අංක 896/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ සබරගමුව විශ්වවිද්‍යාලයේ පීඨයන් හා අධ්‍යයන අංශයන් දක්වන ලද උපලේඛනය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ. :-

(1) එහි I වන තීරයේ සඳහන් "වෛද්‍ය පීඨය" යන අයිතමයට සහ එහි II වන තීරයේ අනුරූප සටහන්වලට ඉක්බිතිවම (2018 අගෝස්තු මස 01 වන දින අංක 2082/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති) පහත දැක්වෙන නව අයිතමය සහ සටහන් එකතු කිරීමෙන් එහි උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

| "*I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| පරිගණක පීඨය | 1. මෘදුකාංග ඉංජිනේරු අධ්‍යයන අංශය |
| | 2. දත්ත විද්‍යා අධ්‍යයන අංශය |
| | 3. ආගනණය සහ තොරතුරු පද්ධති අධ්‍යයන අංශය |



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(2) එහි I වන තීරයේ සඳහන් ''ව්‍යවහාරික විද්‍යා පීඨය'' යන අයිතමය සහ ඊට අනුරූපීව එම උපලේඛනයෙහි II වන තීරයේ සඳහන් වන්නා වූ සියලු අයිතමද (2011 පෙබරවාරි මස 01 වන දින අංක 1691/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති) ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 1. ස්වභාවික සම්පත් අධ්‍යයන අංශය |
| | 2. භෞතික විද්‍යා සහ තාක්ෂණ අධ්‍යයන අංශය |
| | 3. ආහාර විද්‍යාව සහ තාක්ෂණවේදය අධ්‍යයන අංශය |
| | 4. ක්‍රීඩා විද්‍යා සහ ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය.''. |

**ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,**
අධ්‍යාපන අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0348

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.